


### මෙතෙක් කතාව

උසස් අධ්‍යාපනය සඳහා ඔස්ට්‍රේලියාවට එන මට විශ්ව විද්‍යාලයයේදී ගුරුසිංහ ඇමතිවරයාගේ පුතා වන අශේන් හමුවෙයි. අන්තර්ජාලයේදී මට හමුවන විශ්ව ත් මා ඔස්ට්‍රේලියාවේ නැවතී සිටින මාමාගේ පුතා වන සුනෙත් අයියාත් මගේ දිවියේදී මා හා සමාන්තරව යමින් සිටියි. අම්මා සිය දෙවන විවාහයේ සැමියා වන ජයසිරි අංකල් සමග ඔස්ට්‍රේලියාවට එන්නේ මේ අතරේදීය ජයසිරි අංකල් අශේන්ගේ ඥාතියෙකි. තාත්තා ගුරුසිංහ ඇමතිට එරෙහිව ඡන්ද ව්‍යාපාරයට එන්නට උත්සාහ කරයි. වසරාවසාන නිවාඩුවේදී අප ගිය විනෝද සවාරියේදී නැන්දා සහ ජයසිරි අංකල් හැසිරුණේ මසිතේ යම් සැකයක් ඇති වන පරිදි ය. සුනෙත් අයියා නිවසෙන් යන්නට ගියේ මේ කාරණය නිසා ය. විශ්ව තමා විවාහ වූ බව හදිසියේම දවසක කියයි. සුනෙත් අයියා අමන්දා නම් තරුණිය හා හිතුවක්කාර ලෙස විවාහ වූ බව ඇසූ මාමා කෝප විය. නැන්දාගේ අනියම් සම්බන්ධය පිළිබඳව මෙතෙක් කල් නිශ්ශබ්දව සිටි මාමා ඇ සමග කලහ කරගෙන නිවසින් පිටව ගියේ ය. මාමා අනතුරකට ලක් මිය ගියේ එදා ය. ජයසිරි අංකල්ගේ බලපෑමෙන් මිදන්නට මම නිවසින් පිටවුණෙමි

**අද එතැන් සිට**

පහන් කණු වෙතින් විහිදෙන ආලෝකයෙන් දිදුලන මං මාවත් ඔස්සේ කුලී රිය ඇදෙයි. අශේන් කොයි කොදෙව්වක සිටින්නේ ද යන්න පිලිබඳ හාංකවිසියක් වත් නොදන්නා මම කුලී රථ රියැදුරා කෙරෙහි විශ්වාසය තබා සිත් පිත් නැති රූකඩයක් සේ පසුපස අසුනේ වාඩි වී සිටියෙමි. වාහනය ගමන් කරමින් සිටින්නේ කොයි ඉසව්වකද කියා හෝ මම නොදත්තෙමි. සොයා බලන්නට උවමනාවක්ද නොවී ය.

පසුපස බලන කන්නාඩිය තුළින් වරින් වර මදෙස විමසුම් බැලුම් හෙළන රියැදුරා ගේ ඇස් මට පෙනෙයි. පිස්සියක සේ මහ රැයක මේ යන ගමන පිළිබඳව ඔහු සිත තුළ විමතියක් ඇතිවා සේ ය. ඒ කිසිවක් සිතන්නට තරම් පැහැදිලි මානසික තත්වයක මම නොසිටියෙමි. මා දැන සිටි එකම දෙය නම් පසු පසින් හඹා එන මොකක්දෝ වියරු බලවේගයකින් ගැළවීම සඳහා මා පළායමින් සිටින බව පමණකි. ජයසිරි නමැති පාපී මිනිසාගේ සෙවනැල්ල වත් නොවැටෙන ඉසව්වකට පළා යන්නට මට ඇවැසි වී ඇත. අශේන් මගේ ගැළවුම් කරුවා වනු ඇති බව මට සහතික ය.

මට අම්මා සිහිපත් වෙයි. ඇය උදෑසන නැගිට මා සොයනු ඇත. මට ඇය ගැන ඇතිවන්නේ වචනයට පෙරලිය නොහැකි තරමේ කණගාටුවකි. ඇය විනාශ වෙමින් සිටින්නී ය. මට එය වළක්වන්නට තරම් ශක්තියක් නැත. මේ මොහොතේ මම ආත්මාර්ථකාමී වී ඇත්තෙමි. හෙට දවසේ අම්මාගේ ඉරණම කුමක් විය හැකිද යන්න ගැන සිතා බලනවාට වඩා අද දවසේ මා ගැන සිතන්නට මම පෙළඹී සිටින්නෙමි. එය වරදක් ද නැද්ද යන්න ගැන තර්ක කර සිතා බලන්නට ඉස්පාසුවක් මට නැත.

දෑස් කෙවෙණි තුළ කඳුළු පිරී ඇති හෙයින් රිය කවුළුවෙන් පිටත මට පැහැදිළිව නොපෙනෙයි. ඒ කඳුල වරින් වර කම්මුල් දිගේ රූරා ගලා බසිනු දැනෙයි. රියැදුරාට පෙනෙතැයි සිතා ඒවා පිසදා ගන්නට මට අවශ්‍යව තිබුණි. එනමුදු මම අතපය සොළවා ගත නොහැකි ආබාධිතයකු සේ අසරණ ව සිටියෙමි. අකර්මන්‍යව සිටියෙමි.

"ආ යූ ඕකේ...?" රියැදුරා අසන්නට ඇත්තේ බලා සිට බැරිම තැන විය යුතු ය.

මම පිළිතුරක් නොදුන්නෙමි. ඔහු නැවත ප්‍රශ්න කරන්නට උත්සාහ නොකළේ ය. මම නැවත කවුළුව තුළින් පිටත බලා සිටින්නට උත්සාහ කළෙමි. වාහනය තට්ටු නිවාසයක් ඉදිරියේ නවතන තෙක්ම මම නිනව්වක් නොමැති ව ඉවත බලා සිටියෙමි. වාහනය නැවතුණ පසුවද කුමක් කළ යුතු දැයි සිතා ගත නොහැකිවාක් මෙන් මම වාඩි වී සිටියෙමි.
"දිස් ඉස් ද ප්ලේස්..." රියැදුරා පසු පස බලන කණ්නාඩිය තුළින් මදෙස බැළුවේ ය. මම මුදල් පසුම්බිය ඇර එතුළ වු නෝට්ටු කීපය ගණන් නොකරම රියැදුරා අතට දී වාහනයෙන් බැස්සෙමි.

"කීප් ද බැලන්ස්.." මම යන්තම් වචන කීපයක් ගැට ගසා ගත්තෙමි.

වාහනය පිටව යන හඬ මා පිටුපසින් ඇසුණි. ඒ නිහඬ රැයේ නන්නාඳුනනා පෙදසෙක තට්ටු නිවාසයක් ඉදිරියේ මම වික්ෂිප්ත වූ මනසකින් යුතුව තනි ව බලා සිටියෙමි. මට ම අවනත නොවෙන දෙපා අද්දමින් ගොස් අශේන් ගේ නිවසේ දොර අබියස නැවතුනෙමි. ගැහෙන හදින් යුතුව දොරේ සීනුව එබුවෙමි. දැන් දැන් දොර ඇරෙනු ඇතැයි බලා සිටියෙමි.
අශේන් නොසිටියොත් ...? මම සිතුවෙමි. ඒ සිතිවිල්ල පවා මසිත කලබලයට පත් කලේ ය.
තුන්වන වතාවට සීනුව නාද කිරීමෙන් පසු කිසිවකු දොර වෙත එන හඬ මට ඇසුණි. මම නොයිවසිල්ලෙන් බලා සිටියෙමි. විවර වුණ දොර අබියස අශේන් සිටගෙන සිටියේ ය. අවුල්ව ගි හිස කෙසින් යුතුව ඇකිළුණ දෑසින් මා දෙස බලා සිටි ඔහු මා නොහැඳිනූ බවක් පෙන්නුම් කළේ ය. කලුවර නිසා එසේ වන්නට ඇතැයි මට සිතුණි
"අශේන් මම... මම කෞශල්‍යා..." මම කීවෙමි.
"ඕහ් .. "ඔහු කිවේ ය. ඔහු බීමත්ව සිටිතැයි මට සිතුණි.
"ඕහ්.. ක.. ක.. කෞෂි.." ඔහු මට ගෙතුළට එන්නට දොර වෙතින් මෑත් වෙමින් මිමිණුවේ ය. ".. ඇ.. ඇතුළට එන්න..."
මම බෑගයත් ඇදගෙන ගෙතුළට පිය මැන්නෙමි. මොළය පසා කරගෙන යන සිගරට් ගඳින් හා පිළුණු ගඳින් ගෙය පිරී පැවතුණි.
"සො... සොරි.. කෞෂි.." ඔහු සාලයේ සැටිය මත විසිර තිබූ සුන් බුන් ඉවත් කර මට වාඩිවන්නට තැනක් සකසන අතර කීවේ ය.
".. මේක හරිම මෙස් එකක්.. "
"කමක් නැහැ.. කරදර වෙන්න එපා.." මම සැටියේ කෙළවරක යන්තමින් වාඩි වන අතර කිවෙමි.
ඔහු මා ඉදිරියේ දණගසා මගේ දෙඅත් අල්ලා ගත්තේ ය. "මං හිතුවා... ම.. මං හිතුවා දවසක ඔයා මා ළඟට එයි කියලා .." ඔහු කිවේ ය. ඔහුගේ රතුව ගිය දෑස් මගේ දෑස් හා ගැටී තිබුණි. ඒ දෑසේ මා දුටුවේ ආදරය නම් නොවේ වෙනත් මොකක්දෝ ගින්දරක් පමණකි
ඔහු කෙරහි උපන් මහත් අප්‍රසාදයකින් මසිත පිරෙනු මට දැනුණි. මේ මහ රෑ මා ඔහු සොයා ආවේ ඇයිද කියා හෝ අසන්නට ඔහු කල්පනාවක් නැති සේ ය.
"අශේන්.. " මම කියන්නට උත්සාහ ගත්තෙමි..
"ක.. කෞෂි.. මට අද හරිම.. හරිම සතුටුයි... ම.. මං ඔයාට තේ එකක් හදන්න ද?" මගේ කතාවට ඉඩක් නොතබා ම ඔහු අසයි.
"එපා.." මම කිවෙමි.
"ප්‍රශ්නයක් නෑ..ප්‍රශ්නයක් නෑහ්... මං හදන්නම්.." ඔහු නැගිටින්නට තැත් කළේ ය. ඔහුගේ පය වැදී බිම තිබූ බෝතලයක් පෙරළෙනු මම දුටුවෙමි. පෙරළුණ බෝතලය තුළින් ගලා ආ මත්පැන් ගඳින් සාලය පිරී යනු මට දැනුණි. ඔහු වහා බෝතලය කෙළින් කලේ ය.
"සොරි කෞෂී.. ඊයෙ රෑ යාළුවෝ දෙතුන් දෙනෙක් සෙට් වුණා.. දන්නැද්ද ඉතින්... පොඩි ඩ්‍රින්ක් එකකට.. කාපු බීපු තැනක් පිළිවෙකට අස් කරළා යන්න මුන් දන්නෙ නැහැනෙ.." ඔහු වරදක් කර අසුවූ පොඩි දරුවෙකු සේ නිදහසට කාරණා කියන්නේ යයි මට සිතුණි. සමහරවිට ඔහු කියන්නේ ඇත්ත විට හැකි ය.
"අශේන්... මට යමක් කියන්න තියෙනවා.." මම කිවෙමි.
"ක .. කතා තරමු කෞෂි.. කතා ... ක..ර..මු... දැන් අපිට ඔනෙ තරම් කතා කරන්න පුළුවන්..- ඔහු දොඩවයි. මට කෑ ගසා හඬන්නට සිතෙයි. සහනයක් පත.ා ඔහු සොයා පැමිණි මා ගැන සිතන්නට ඔහුට සිහියක් නැත.
"-අශේන්... " මම හැකි තරම් වෙර යොදා කෑගැසුවෙමි... " දෙයියන්ගෙ නාමෙන් ඔය දෙඩවිල්ල නවත්තලා මට ඇහුම් කන් දෙන්න.." මම හැඬුම අතරින් කෑගැසුවෙමි.

ඔහු ප්‍රශ්නාර්ථයක් රැඳුණ මුහුණින් මදෙස බලා සිටියේ ය. -කි.. කියන්න..- ඔහු කීවේ ය.
"මං ආපහු යන්නෙ නැහැ අශේන්.." මම මහත් වෑයමින් කීවෙමි. මොහොතක් විශ්මයෙන් මදෙස බලා සිටි අශේන් වහා පැන මා වැළඳ ගත්තේ ය.
"කවදාවත් යන්න හිතන්න එපා කෞෂි.. " ඔහු මා සිපගන්නා අතර කීවේ ය.".. ඔයා මා එක්කම ඉන්න.. මං ..මං ඔයා ඔයා මා ළඟට එනකල් කොච්චර නම් බලා හිටියද..?"
ඔහු වෙතින් එන සිගරට් ගඳත් මත්පැන් ගඳත් මම මහත් ආයාසයකින් විඳ දරාගෙන සිටියෙමි. ඔහුගේ අතොරක් නැති සිප වැළඳ ගැනීම් මට මහත් වධයක් විය. මට අවශ්‍යව තිබුණේ මගේ හිතේ වේදනාව, කණගාටුව ඔහු හා බෙදා ගන්නටය.
ඔහුගේ උරහිස මත හිස හොවාගෙන මගේ දුක නිවෙන තෙක් හඬා වැටෙන්නටය. ඔහු මට සවන්දෙනු ඇතැයි මම බලාපොරොත්තුව සිටියෙමි. ඔහු මගේ හිස පිරිමැද මා සනසවනු ඇතැයි මම අපේක්ෂා කළෙමි.
"අඬන්න එපා කෞෂි.. මම ඔයා බලාගන්නවා" යි ඔහු ගෙන් අසා ගන්නට මම බලාපොරොත්තු වූයෙමි.

මගේ එක වචනයකට හෝ සවන් දෙන්නට ඉස්පාසුවක් අශේන්ට නොවී ය. ඔහු සිටියේ අසිහියෙන් මෙනැ යි මම සිතුවෙමි. මම සිත්පිත් නැති රූකඩයක් සේ නිහඬව සිටියෙමි. ආත්මානුකම්පාවෙන් රිදුම් දෙන සිත හඬා වැටෙද්දී මම ගලක් සේ ඉවසා සිටියෙමි. මගේ නිහඬ බව ඔහුට අනුබලයක් වන්නට ඇත.
ඒ රාත්‍රිය බොහෝ දිග එකක් විය. මම අකැමැත්තක් හෝ කැමැත්තක් හෝ නොපෙන්වා උපේක්ෂා සහගතව ඒ රාත්‍රියට මුහුණ දුන්නෙමි. ජීවිතය බේරාගන්නට සිංහයාගෙන් ගැලවී කොටියාගේ ගුහාවට රිංගා ගත් අසරණ මුවැත්තිය මම වූයෙමි.

අලුයම වන විටත් මම නිදිවර්ජිතව ඇහුම් කන් දෙමින් සිටියෙමි. ඔහු ගොරවන හඬ මට ඇසෙයි. මහත් තෘප්තිමත් බවක් ඒ මුහුණින් දිස් වෙයි. මට මා ගැනම ඇති වන්නේ කෝපයකි. හිස අද්දර ඇති මේස ලාම්පුව ගෙන ඒ මුහුණ හරහා වැරෙන් පහරක් ගසන්නට මට සිතෙයි. මේ ලෝකයම කීතු කීතු කර ඉරා දමන්නට මට ඇවැසිය. මේ ලෝකයම විනාශ කර දමන්නට මට ඇවැසිය.

මට නින්ද ගියේ කොයි වෙලාවේදැයි කියන්නට මම නොදත්තමි. ශාරීරික හා මානසික වෙහෙස විසින් මා බොහෝ වේලාවක් නිදි ගන්වනු ලැබ තිබුණි. ඇළවී ගත් වනම හිස හරවා ඇඳේ අනෙක් කෙළවර බැළුවෙමි. අශේන් එහි නොවී ය. ඔහු නාන කාමරයට යන්නට ඇතැයි මට සිතුණි.

19 පිටට

